5 වන පිටෙන්

වෙනම ප්‍රසංගයක් ඇරඹූ අතර, එකී ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය, එම ප්‍රසංගය උදෙසා සාමාජිකයින්ගේ දරු-වන්ට පමණක් නොව අනෙක් දරු දැරියන් හටද අවස්ථා සලසන ලදී.



දෙදාහ දශකයේ මුල සිට කිව් සහ ග්ලේන්වේවැලි ප්‍රදේශවල හිත මිතුරන් තම දරුවන්ගේ කලා කටයුතු එළිදැක්වීමට ආරම්භ කළ ප්‍රසංග මාලාවක්, පසුව ශ්‍රී

**<u>එහෙත් ප්‍රේක්ෂකාගාරයේදී මේ දෙමාපිය ඥාති මිත්‍රාදී බහුතරයගේ සමස්ථ රංගයට වඩා රසවිඳින්නේ තෝරාගත් අංග ය. වෙනත් ලෙසකින් කිවහොත් තම දරුවාව සමස්ත රංග ක්‍රියාවෙන් වියුක්ත කරගෙන රස විඳීමක් කරනා ඔවුහු දරුවා සිටින අංගය අවසන් වූ පසු වෙනත් අරමුනක් කෙරෙහි හිත යොමු කරන්නෝ ය.</u>**

මිතුරු සංවිධානය යටතේ සංවිධානය වී ද්විවාර්ෂිකව අදටත් පවත්වයි. මා පාසල් යන අවධියේ ලියා මුද්‍රණය කළ නාට්‍ය පිටපතක් වන "නලා කාරයෝ" හි ප්‍රතිනිර්මාණයක් එම සාමාජිකයන්ගේ දරුවන් යොදා පුහුණු කර පෙන්වන්නේ 2004 වර්ෂයේදීය.

රත්නා ගුරුසිංහ පැවසූ ලෙස, 1980 දශකයේ ආරම්භයේ දී ශාන්ති රාජේන්ද්‍ර වැනි අයගේ නර්තන පංති පැවැත්වනු ලැබූ නමුදු විධිමත්ව සිංහල සම්ප්‍රදායික නර්තන වැඩමුළු ඇරඹෙන්නේ එම දශකයේ අගභාගයේ දී සිංහල සංස්කෘතික පදනමේ අනුග්‍රහයෙන් ඥාණා මාගම්මන පැවැත් වූ නර්තන වැඩමුළු මගින්ය. පෞද්ගලික ඉගැන්වීම් ලෙස විධිමත්ව දරුවන් හට කලා ශිල්ප ඉගැන්වීම සිදුවන්නේ දෙදාහ වසරේ මැද භාගයේ සිටය. ජනප්‍රිය වෙමින් පවතින පෞද්ගලික ඉගැන්වීමවල දී නර්තන විෂය උදෙසා මූලික වූවන් අතර රසිකා කුලතුංග, ජයන්ති ඉලංගකෝන්, බේමා, රංගන සහ උදුම්බරා යුවළ, සරෝජිනි, සහ පසුව අමා ආදී නර්තන ආචාර්වරුන්ය. එම පන්ති වර්තමානය වනවිට ගණනින් බොහෝමයකි. දරුවන් සඳහා සංගීතය පංති පැවැත්වූවන් අතර වාසනා වීරකෝන් සඳහන් කළ හැකිය.

මෙකී පෞද්ගලික නර්ථන පන්තිවල විශේෂයක් වුණේ එම පංති මගින් වාර්ෂිකව හෝ බොහෝවිට ද්වි වාර්ෂිකව සහභාගිවන දරු දැරියන්ගේ කුසලතා හෙළි දැක්වීම උදෙසා ප්‍රසංග සංවිධානය කිරීමය. එක් අතකින් ප්‍රසංගයක් යනු දරුවන්ගේ පමණක් නොව ගුරුවරුන්ගේ දක්‍ෂතා පෙන්වන රඟමඩලක්ය. මේ ප්‍රසංග සඳහා ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික නාර්තනාංග ද, ගීත හෝ සංගීත උදෙසා කෙරෙන නිර්මාණාත්මක රංග ද අඩු වැඩි වශයෙන් යොදාගනු ලබයි. ඇතැම් පංති පවත්වනුයේ සංදර්ශන අරමුණු කරගෙනම ය.

රංගකලාවේ නාට්‍ය විෂයධාරාවේ දී කැපී පෙනෙන්නේ කුසුම්සිරි ලියනාරච්චි සහ යශෙ-්ද්‍රා සරච්චන්ද්‍ර යුවළ මූලික ව ආරම්භ කළ පෞද්ගලික රංගකලා වැඩමුළු සහ එමගින් හෙළිදැක්වීම් කළ වේදිකා නාට්‍යයි. දෙදාහ දශකයේ අග සිට එම කාර්යයේ නිරත ඔවුහු දරුවන් උදෙසා දරුවන් යොදාගත්, දරුවන් සඳහා දරුවන් සහ වැඩිහිටියන් ව මිශ්‍රව යොදා ගන්නා නාට්‍යය, දරුවන් උදෙසා වැඩිහිටියන් යොදාගත් නාට්‍යය පමණක් නොව, දරුවන්හට ද නාට්‍යය නිර්මාණයට අවස්ථා සපයයති. දඟයා සහ මුත්තාගේ විත්ති (2008) ඇරඹුන වැඩමුළු රංග නිෂ්පාදන අතර පුංචි අන්දරේ (2010) පුංචි පැංචි, ගමරාළයි සුදු අලියයි, මී අප්පු, විසිරා, ආදී නාට්‍යය සඳහන් කළ හැකිය.

දරුවන් සමඟ කලා කටයුතු කරනු ලබන තවත් ප්‍රජා සංවිධාන දෙකක් ලෙස මිහිඳු ළමා පදනම ද, මෙල්බර්න් හි මුතුහර ළමා සමාජය ද අගය කළ යුතුය.

සමාජ සංවිධානය සහ පෞද්ගලික සංගම්වලින් අවස්ථා සපයනවාට අමතරව දෙමාපිය අනුග්‍රහය යටතේ ද දරු දැරියෝ පෞද්ගලිකව තම රංග කලා කුසලතා හෙළි දක්වති. එයට හොඳම උදාහාරණයක් වන්නේ සුධාරක ද සිල්වා දරුවා කලකට පෙරාතුව ඉදිරිපත් කළ ජනගී ආශ්‍රිත ප්‍රසංගයයි.

මේ සියලු දේ අතර දරුවන් සහභාගිවන්නාවූ රංග කටයුතවල ප්‍රධාන දායකයෝ වන්නාවූ ඒ දරුවන්ගේ දෙමාපියෝ ගැන ද කියයුතු මනාය. මැසිවිලි නගමින් වුවද තම දරුවන්ගේ රංග පුහුණු සඳහා කැඳවාගෙන යන එම දෙමාපියන්ගෙන් බහුතරයක් එකී වැඩස-ටහන් හි සංවිධානය කටයුතුවල බර ද දරන්නෝය. රංගවස්ත්‍ර ආදී අලංකරණ සඳහා පිරිවැය ගෙවා, දැන්වීම් අනුග්‍රහ සොයා දී ප්‍රවේශපත් මිලදී ගැනීමට අමතරව හිත මිත්‍රයන්ට ප්‍රවේශපත් විකුනන්නේ ද බහුතර ඔවුන්මය. ප්‍රේක්ෂකාගාරයේදී මේ දෙමාපිය ඥාති මිත්‍රාදී බහුතරය සමස්ථ රංගයට වඩා රසවිඳින්නේ තෝරාගත් අංගය. වෙනත් ලෙසකින් කිවහොත් තම දරුවා සමස්ත රංග ක්‍රියාවෙන් වියුක්ත කරගෙන රස විඳීමක් කරනා ඇතැමෙක් දරුවා සිටින අංගය අවසන් වූ පසු වෙනත් අරමුනක් කෙරෙහි හිත යොමු කරති.

බොහෝ ප්‍රසංගවල දී වැඩිහිටි බලපෑම තිබුණ ද, ඇතැම් අවස්ථාහි දී දරුවන් විසින් ම රංගයන් නිර්මාණය කර දරුවෙ-්ම සහභාගි වී ඉදිරිපත් කරති. එහෙත් සැලකිල්ලට ගත යුතු කරුණක් වන්නේ, ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ඇතැම් රංගයන් ප්‍රතිනිර්මාණය කිරීමය. වැඩිහිටි රංගයන් හෝ ගායනා මුල් කරගෙන ප්‍රතිනිර්මාණය කරනා එම රංගනයන් කොතෙක් දුරට දරුවන් හට උචිත ද සහ ඒවා දරුවන් අරමුණු කරගත්තේ ද යන්න විමසා බැලිය යුතුය. වැඩිහිටියන්ගේ බලපෑම ඇති විවිධ ප්‍රසංගවලදී ද මේ තත්වය සැලකිලිමත් විය යුතුය.

